# කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.

## නිවිතිගල අධ්‍යාපන කලාපය.

## 9 - ශ්‍රේණිය - - ඉතිහාසය -2021-පළමු වාරය

පැවරුම :- 05 වන සතිය (2021.01.31 සිට 2021.02.06 දක්වා)

ඒකකය 01 :- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි යටතට පත්වීම.

**විශේෂ මාසික පරීක්ෂණය 01 (ජනවාරි මාසය)**

***ක්‍රියාකාරකම***

සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

01) පෙරදිග ප්‍රදේශවල බලය තහවුරු කරගත් යුරෝපීය ජාතීන් තුනක් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

02) පෘතුගාලයේ පැවති ප්‍රධාන වෙළඳවරාය කුමක් ද?

03) ලන්දේසින් කුමන ආගමික භක්තිකයන් පිරිසක් ද?

04) ලන්දේසින්ට ලිස්බන් වරායේ වෙළඳාම් කිරීම තහනම් කළ පාලකයා නම් කරන්න.

05) ලන්දේසින් පිහිටවූ වෙළෙඳ සමාගම කුමක් ද?

06) ලන්දේසින් හට වෙළෙඳා පිළිබඳ රාජකීය අවසරපත හිමිවීමක් සමග පෙරදිග ප්‍රදේශවල ඔවුන්ට හිමිවූ බලතල තුනක් දක්වන්න.

07) ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි දූත පිරිසේ නායකයා නම් කරන්න.

08) 1638 ලන්දේසින් සමග ගිවිසුම් ගතවූ රජු නම් කරන්න.

09) 1638 ගිවිසුමේ ප්‍රධාන වගන්ති දෙකක් දක්වන්න.

10) පෘතුගිසින් පළවා හැර ලන්දේසින් ගෙන්වා ගැනීම හා බැඳුණ ප්‍රස්ථාව පිරුළ කුමක් ද?

11) ක්‍රි.ව. 1721 උඩරට රජු මුණගැසීමට ගිය ලන්දේසි දූතයා නම් කරන්න.

12) ජෙනරල් ජෙරාම් හල්ෆ්ට්ගේ දූතගමනේදී රජු විසින් ලන්දේසින්ට පිරිනමන ලද ත්‍යාග තුනක් දක්වන්න.

13) ලන්දේසින් හා උඩරට රජු අතර මිත්‍රත්වය වර්ධනයට දෙපාර්ශ්වයම අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් දක්වන්න.

14) නායක්කර් වංශයේ ප්‍රථම රජු නම් කරන්න.

15) 1766 ගිවිසුමට අත්සන් තැබූ උඩරට පාලකයා කවුරුන් ද?

සැකසුම :- උදාර අරවින්ද
නිවිතිගල කලාප කාර්යාලය
ර/කලවාන ජාතික පාසල